**අභ්‍යන්තර චක්‍ර ලේඛ අංක - 06/2020**

මගේ අංකය - BD/GH/CPHMA/01/2013

පළාත් මහ රෝහල

බදුල්ල

2020.05. 23

සියළුම විශේෂඥ වෛද්‍ය නිලධාරීන්

ප්‍රධාන වෛද්‍ය නිලධාරී (බා. රෝ. අංශය)

සියළුම වෛද්‍ය නිලධාරීන්

ගණකාධිකාරී

රෝහල් ලේකම්

ප්‍රධාන විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී

සහ සියළුම අංශ /ඒකක ප්‍රධානීන් වෙත,

**COVID -19 රෝග ව්‍යාප්තිය වළක්වා ගැනීම සඳහා රෝහල් සේවා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම**

2020.04.28 දින බදුල්ල, පළාත් මහ රෝහලේ පැවති COVID -19 රැස්වීමේදී සාකච්ඡා කර තීරණය කළ පරිදි රෝහල තුළ මේ වනවිට ක්‍රියාත්මක වන සේවා මට්ටම්වලට බාධාවක් නොවන පරිදි ,රෝගී සත්කාර සේවාව අඛණ්ඩව, ගුණාත්මකව හා නිර්බාධිතව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි කාර්ය මණ්ඩළ සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය.

02. ඒ අනුව සෑම වාට්ටු/ඒකක/අංශයන්හි රෝගී සත්කාර සේවා පවත්වා ගෙන යාමේදී **ගැටළු ඇති නොවන පරිදි සහ බාහිර පැමිණිළි ඇති නොවන පරිදි කණ්ඩායමක් ලෙස රාජකාරී කළ යුතු** බවද කාරුණිකව සිහි කැඳවමි.

03. එබැවින් දැනට පවතින COVID -19 වසංගත තත්ත්වය මධ්‍යයේ තම සේවය කැපවීමෙන් නොපිරිහෙලා ඉටු කරන රෝහල් කාර්ය මණ්ඩලයේ ශාරීරික හා මානසික යෝග්‍යතාවය පවත්වා ගැනීමත් එම කාර්ය මණ්ඩළය රැකගැනීමත්, ජාතික අවශ්‍යතාවයක් වන බැවින්, ඔවුන්ට ආරක්ෂාව හා පහසුකම් සැළසීමේ අරමුණින් ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 හා 2020.04.18 දිනැති චක්‍රලේඛනය පරිදි රෝහල් කාර්ය මණ්ඩළය සේවයේ යොදවා ගැනීම හා නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් පිළිපදින ලෙස මෙයින් දන්වමි .

I. මෙම අවස්ථාවේදී අඛණ්ඩ, කාර්යක්ෂම හා නිර්බාධිත සේවාවක් පවත්වා ගෙන යාමට හැකි වන පරිදි හා **අවම සේවක සංඛ්‍යාවක් යෙදවෙන ලෙස රාජකාරී අවශ්‍යතා ආවරණය වන පරිදි** සේවක කාර්ය මණ්ඩළය, කණ්ඩායම් සේවයේ යෙදවීමට සේවාමුර සකස් කළ යුතුය.

II. විශේෂඥ වෛද්‍ය/ වෛද්‍ය නිලධාරීන්ගේ සේවාමුර අදාළ ඒකක ප්‍රධානීන් විසින්ද, හෙද නිලධාරීන්ගේ සේවා මුරයන් වාට්ටු/ ඒකක භාර හෙද සොයුරියන්/හෙද සොයුර/ඒකක ප්‍රධානීන් විසින් විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීගේ එකඟතාවය ඇතිව ද, පරිපූරක/අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩළ තම ඒකක/අංශ ප්‍රධානීන් මඟින්ද අනෙකුත් කාර්ය මණ්ඩළ තම ඒකකය භාර ප්‍රධානීන් මඟින්ද, කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවාමුර අදාළ ඒකක/අංශ ප්‍රධානීන් /අධීක්ෂණ නිලධාරීගේ එකඟතාවය පරිදි රෝහල් ඕවර්සියර් විසින්ද සකස් කර රෝහල් පරිපාලනයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

III. පොදු සේවාමුර සකස් කිරීමේදී අදාළ වන පරිදි විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී/ රෝහල් ඕවර්සියර් විසින් මාසික සේවා මුර සකස් කිරීමට කටයුතු කිරීම.

IV. සේවාමුරය මඟින් නොපැමිණීමට සළකුණු කර ඇති නිලධාරීන්/සේවකයින් සඳහා පමණක් විශේෂ නිවාඩු සේ සළකා කටයුතු කිරීම හා ඊට පරිබාහිරව ලබා ගන්නා නිවාඩු තම පෞද්ගලික නිවාඩු සේ සළකා කටයුතු කිරීම.

V. COVID වාට්ටුවෙහි සේවය කරන නේවාසික කාර්ය මණ්ඩලය සඳහා සේවා මුරයෙන් පසුව පැය 48 ක නිවාඩුවක් ලබා දීම.

03. කළින් අනුමත කර ගන්නා ලද සේවා චක්‍රය අවස්ථාවෝචිත පරිදි පූර්ව අනුමැතියකින් සංශෝධනය කිරීමේ හැකියාව ඇති අතරම , සේවාමුර ක්‍රමය පැවතියද හදිසි සේවා අවශ්‍යතාව මත සේවයට කැඳවීමේ හැකියාව පවතින බවද දන්වමි.

05. මෙම අවධානම් තත්ත්වය යටතේ, රෝහල් සේවාව කාර්යක්‍ෂමව හා අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ඔබගේ සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

අධ්‍යක්‍ෂ
පළාත් මහ රෝහල
බදුල්ල

Dr. Upul Karunarathne
MBBS.MSc(Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.